**ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන" - ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන**

**කමිටු රැස්වීම් වාර්තාව**

**2021.01.30**

"ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීමේ ජාතික වැඩසටහන" යටතේ ක්‍රියාත්මක **ග්‍රාමීය යටිතල පහසුකම්** සංවර්ධන කමිටු රැස්වීම, එම කමිටුවේ ප්‍රධානීන් වන ගරු කැබිනට් අමාත්‍යවරුන්ගේ හා රාජ්‍ය අමාත්‍යවරුන්ගේ ද දිස්ත්‍රික්කයේ ගරු අමාත්‍යතුමන්ලාගේ ද දිස්ත්‍රික්කයේ ගරු පාර්ලිමේන්තු මැති ඇමතිවරුන් හා දේශපාලන නියෝජිතයින් මෙන්ම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ රජයේ නිලධාරීන් හා විවිධ විෂයයන් වලට අයත් ක්ෂේත්‍ර නියෝජනය කරන නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගැනීමේ කතාව සහ ඉහත කමිටුවට අදාලව දිස්ත්‍රික්කයේ වර්තමාන තත්ත්වය පැහැදිලි කරන ලදි.

අනතුරුව වාරිමාර්ග ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමන් විසින් සභාවේ කටයුතු ආරම්භ කරමින් සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව **ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන** කිරීම සඳහා පවතින අවශ්‍යතාවය පෙන්වා දෙමින් එක් එක් අමාත්‍යාංශවලට අදාලව අමාත්‍යාංශ විසින් මේ සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගතයුතු බවට දන්වන ලදි. මෙම සාකච්ඡාවේදී ලේකම්වරුන් විසින් එකී අමාත්‍යාංශ විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිදුකරන කාර්යයන් පිළිබඳව ඉදිරිපත් කිරීම් සිදුකල අතර දිස්ත්‍රික් ලේකම්තුමා විසින් ඉදිරිපත් කල කරුණු මෙන්ම හම්බන්තොට දිස්ත්‍රික්කයට අදාල ගැටළු හා යෝජනා සම්බන්ධව ලබාදුන් අත්පොතෙහි ඇතුලත් කරුණු පිළිබඳවද, එම අවස්ථාවේ පැමිණ සිටි අයගේ අදහස් හා යෝජනා ද සාකච්ඡාවට ගැනුණු අතර එක් එක් අමාත්‍යාංශ වලට අදාලව සාකච්ඡාවූ කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.1 | විදුලිබල ක්ෂේත්‍රය | වලස්මුල්ල මුරුතවෙල වෝල්ටීයතා බැස්ම අවම කිරීම සඳහා නව උපපොළ ඉදිකිරීමේ දී ඉඩම් අවසරය ලබා ගැනීම ගැටළුවක් වීම. | මේ වන විට එම ගැටළුව විසඳී ඇති බව දන්වන ලදි. | විදුලිබල අමාත්‍යාංශය |
| 1.2 | | බෙලිඅත්ත කොට්ඨාසයේ ගැටමාන්න දකුණ විද්‍යාලයේ සිට බණ්ඩරවත්ත පොළ දක්වා ප්‍රදේශයේ පවතින විදුලි ධාරිතාවය ප්‍රමාණවත් නොවීම. | දැනට පවතින එකළා විදුලි රැහැන් පද්ධතිය තෙකළා විදුලි රැහැන් පද්ධතියක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය දැනට ආරම්භ කර ඇති බව දන්වන ලදී. | |
| 1.3 | | දිස්ත්‍රික්කය තුළ අඩු ආදායම්ලාභී පවුල් 1100ක් සඳහා විදුලිබලය නොමැති වීම. | ලංකාවේ දැනට විදුලිය නොමැති සෑම පවුලක් සඳහාම විදුලිය ලබාදීමේ ජාතික වැඩසටහන යටතේ දිස්ත්‍රික්කයේ විදුලිය නොමැති පවුල් සඳහා විදුලිය ලබාදීමටත් එහිදී සෑම නිවසක් ආසන්නයටම විදුලි රැහැන් ලගාකර දීමටත් අඩු ආදායම්ලාභී පවුල් වලට විදුලිය ලබා ගැනීමේ පහසුව සඳහා පොලියක් නොමැතිව සහනදායී ණය ක්‍රමයක් හඳුන්වා දී ඇති බවට දන්වන ලදී. | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.4 | විදුලිබල ක්ෂේත්‍රය | ප්‍රජා ජල ව්‍යාපෘතීන්හි ජල පොම්පාගාරවල ජල පොම්ප ධාවනය සඳහා පවතින විදුලි ධාරිතාවය ප්‍රමාණවත් නොවීම. (ඔකෙවෙල - යටිගල ඉහල සිසිල් නදී, කටුවන - ගල්ලිදමුල්ල සමගි, තිස්සමහාරාම- රත්නෙළුම්වල රත්නෙළුම්වලයාය ප්‍රජා ජල ව්‍යාපෘති). | මෙම ප්‍රජා ජල ව්‍යාපෘතින් සඳහා විදුලිය ලබාදීමේ ගැටළුවක් තිබේ නම් කඩිනමින් විසදීම සඳහා උපදෙස් දෙන ලදි. | විදුලිබල අමාත්‍යාංශය ලංකා විදුලිබල මණ්ඩලය |
| 1.5 | | වෙන්දේසි ඉඩම් සඳහා විදුලි පහසුකම් ලබා නොදීම හේතුවෙන් මිලදී ගැනීමෙන් අනතුරුව විදුලි පහසුකම් ලබාගැනීමේදී ගැටළු පවතින බවට කරුණු ඉදිරිපත් විය. | ඉඩම් වෙන්දේසි කිරීමේදී විදුලි පහසුකම් ලබාදීම වෙන්දේසි කරුගේ මූලික වගකිමක් වන බවත් වෙන්දේසි කරුවන් එම ඉඩම් සඳහා මෙම පහසුකම් ලබාදිය යුතු බව හා අදාල ප්‍රාදේශිය සභාවෙන් අනුමත කිරීමට පෙර විදුලිය ලබාදීමට අවශ්‍ය කටයුතු කර ඇති බව තහවුරු කරගතයුතු බවත් දන්වන ලදි. | ලංකා විදුලිබල මණ්ඩලය අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව |
| 1.6 | | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෝඨයිම්බරගම සඳහා විදුලි ධාරිතාව ප්‍රමාණවත් නොවීම. | මේ සඳහා කඩිනමින් විසදුමක් ලබා දීමට උපදෙස් දෙන ලදි. | විදුලිබල අමාත්‍යාංශය ලංකා විදුලිබල මණ්ඩලය |
| 1.7 | | අම්බලන්තොට උප පොළ සඳහා 60 A විදුලි මීටර් හිඟයක් පැවතීම. | එම මීටර හිගයක් පවතින ස්ථාන වලට සති දෙකක් ඇතුලත ලබාදීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | ලංකා විදුලිබල මණ්ඩලය- හම්බන්තොට |
| 1.8 | | කර්මාන්තකරුවන් විදුලි සම්බන්ධතාවය ලබාගැනීමේදී ට්‍රාන්ස්පෝමරයට මුදල් ගෙවා විදුලිය ලබාගැනීමෙන් අනතුරුව KV එකට හා විදුලි මීටරයට විදුලි බිල් දෙකක් ගෙවීම හා KV සඳහා ගෙවීමේදී මාසය තුළ වැඩිම විදුලි ඒකක ප්‍රමාණයක් වැයවූ සීමාවට අනුව සම්පූර්ණ මාසයට බිල සකස් කිරීමෙන් විශාල මුදලක් ගෙවීමට සිදුවන බවට හා එහිදී කර්මාන්ත කරුවන් අපහසුතාවයට පත්වන බවත් මීට වඩා සරල හා සහනදායි ක්‍රමවේදයක් සකස් කිරීමෙන් ජාතික වශයෙන් දේශිය කර්මාන්ත කරුවන්ගෙන් ඉහල නිෂ්පාදනයක් ලබාගත හැකි බවට කරුණු ඉදිරිපත් විය. | මෙය ක්‍රමය වෙනස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත යුතු බවට තීරණය විය.<br>KV ඉල්ලුම් කරන උපරිමයට අවශ්‍ය පහසුකම් ලබාදීම සඳහා මණ්ඩලය පිරිවැයක් දරා ඇති බැවින් එම ක්‍රමය ක්‍රියාත්මක කරන බවට කරුණු ඉදිරිපත් විය.<br>එසේ වුවද, කර්මාන්තකරුවන්ට මේ තුළින් අසාධාරණයක් සිදුවන්නේ නම් මෙම ක්‍රමය වෙනස් කිරීමට භාණ්ඩාගාරය සමග ද සාකච්ඡා කර ප්‍රතිපත්තිමය තීන්දුවක් ගතයුතු බවට තීරණය විය. | විදුලිබල අමාත්‍යාංශය |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.9 | විදුලිබල ක්ෂේත්‍රය | ලබාගත් විදුලි සැපයුම විසන්ධි කිරීමට අවශ්‍ය වූ විටෙක රු. 3000.00 ක මුදලක් අය කිරීම තුළින් විදුලිය විසන්ධි කිරීමක් සිදු නොකර අතහැර යාමට ජනතාව යොමු වීම නිසා සම්පත් නාස්තියක් සිදුවන බවට කරුණු ඉදිරිපත් විය.<br>විදුලි සැපයුම ස්ථිරවම ඉවත් කරන්නේ නම් මුදල් අය නොකරන බවත් තාවකාලිකව ඉවත් කරන්නේ නම් පමණක් රු. 3000.00 ක මුදලක් අයකරන බවත් දන්වන ලදි. | එසේ වුවද, ක්‍රියාත්මක වීමේදී විවිධ තැන් වල විවිධාකාරයෙන් සිදුවන බවට ඉදිරිපත්වූ අදහස් සලකා බලා ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳසොයා බලා ගැටළු තිබේ නම් නිවැරැදි කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | විදුලිබල අමාත්‍යාංශය විදුලිබල මණ්ඩලය |
| 1.10 | | විදුලි කණු ඉදිකිරීමේදී කොන්ත්‍රාත්කරුවන් විසින් මාර්ගවල කණු ඉදිකිරීම නොගැලපෙන ලෙස සිදු කරන බවත් විදුලි රැහැන් ආසන්නයේ කැලෑ එළිපෙහෙළි කිරීමේදී කපන ලද ගස් හා අතු මාර්ග හා වාරි ඇලවල්වල දමා යාම ගැටළුකාරී වීම. | මෙම තත්ත්වය වෙනස් කල යුතු බවට තීරණය වූ අතර ඊට අදාල ගිවිසුම්ගතවීම සඳහා කඩිනම් පියවර ගැනීමට තීරණය විය. | |
| 1.11 | | ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය සභාවට අයත් වීධි පහන් සඳහා වියදම් ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලීම. | එසේ සිදු නොවීම පිළිබඳ සොයා බලා කඩිනමින් විසඳුම් ලබා දීමට තීරණය විය. | |
| 1.12 | | අධිවේගී මාර්ගයේ ගැටමාන්න ගුවන් පාලම ආසන්නයේ අධිබලැති විදුලි රැහැන් සඳහා ඉදිකර තිබූ කණු ගලවා ස්ථාන වෙනස් කලද ඒවා නැවත ගැලවීමට සිදුවූ බැවින් අධික වියදමක් දැරීමට සිදුවන බව දන්වන ලදි. | මෙවැනි කටයුතු වලදී එක් වරම අවශ්‍ය කටයුතු කිරීම සුදුසු බවට තීරණය විය. | |
| 2.1 | සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ක්ෂේත්‍රය | පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් පිළිබඳව ජනතාවගේ දැනුවත්භාවය අඩු වීම. | ජනතාව දැනුවත් කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරන බවට දන්වන ලදි. | |
| 2.2 | | පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සඳහා යොමු වීමේ දී මූලික පිරිවැය අධික වීම සහ ඒ සඳහා පවතින ණය යෝජනාවල ක්‍රමවේදයේ පවතින සංකීර්ණභාවය හේතුවෙන් සාමාන්‍ය ජනතාව එම ප්‍රභවයන් කෙරෙහි යොමු නොවීම. | 4% දක්වා සහන ණය පොලී අනුපාතයක් යටතේ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇති බවත් ණය ක්‍රම වල හෝ බැංකු මට්ටමේ යම් සංකීර්ණ භාවයක් පවතී නම් සරල කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දැනුම් දෙන ලදි. | සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.3 | සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ක්ෂේත්‍රය | රාජ්‍ය ආයතනවල විදුලිය සඳහා අධික පිරිවැයක් දැරීම. | ඉන්දීය ණය පහසුකම් යටතේ, රජයේ ගොඩනැගිලි සඳහා සූර්ය පියසි පද්ධති ස්ථාපනය කරන බවත් ඒ අතර හම්බන්තොට පරිපාලන සංකීර්ණය සඳහා සූර්ය පැනල ලබා දීම ප්‍රමුඛ කාර්යක් ලෙස විශේෂ අවධානය යොමු කර කටයුතු කරන බව දන්වන ලදි. | සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 2.4 | | සූර්ය පැනල ඉදිකිරීම සඳහා ඉදිරිපත්වූ ව්‍යාපෘති යෝජනා සඳහා ඉඩම් වෙන් කලද දීර්ඝ කාලයක් තිස්සේ එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම නිසා නව ව්‍යාපෘති වලට අවස්ථාව ලබාදීමට නොහැකි වීම ගැටළු සහගත බවට කරුණු ඉදිරිපත් විය. | මේ සඳහා එක් සමාගමකට නව ක්‍රමවේදයක් අනුගමනය කිරීම හේතු කොටගෙන අවස්ථාව ලබාදුන්නද නව ක්‍රමවේදය අනුගමනය කිරීමට නොහැකි බව එකී සමාගම දැන්වීම නිසා තීරණයක් ගැනීම ප්‍රමාද වුවද මේ වන විට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බවත්එවැනි ඉල්ලීම් සඳහා කඩිනම් ප්‍රතිචාර දැක්වීමටද කෙටි කාලයක් තුළඉදිකිරීම් සිදු නොකරන සමාගම් ඉවත් කරන ලෙසද දැනුම් දෙන ලදි. | විදුලිබල අමාත්‍යාංශය විදුලිබල මණ්ඩලය මහවැලි අධිකාරිය |
| 3.1 | වාරිමාර්ග ක්ෂේත්‍රය | වැව් තාවුලු වල අනවසර ඉදිකිරීම් සිදු වීම. | වැව් තාවුලු වල අනවසර ඉදිකිරීම් බහුලව තිබෙන අතර මැනුම් නිලධාරීන් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මැනුම්වේදී උපාධිධාරීන් 70ක් බඳවාගෙන මැනුම් කටයුතු සිදු කිරීමේ වැඩපිළිවෙලක් සකස්කර ඇති අතර ඒ සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස් කර මේ වන විට ඉදිරිපත් කර ඇති බවත් දන්වන ලදි.<br>මේ සම්බන්ධව දිස්ත්‍රික් හා ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුද දැනුවත් කිරීමටද තීරණය විය. | වාරිමාර්ග අමාත්‍යාංශය |
| 3.2 | වාරිමාර්ග ක්ෂේත්‍රය | පන්නෙගමුව වැවෙහි ආක්‍රමණකාරී ජලජ ශාක හා රොන්මඩ ඉවත් කර ප්‍රතිසංස්කරණය කල යුතු බවට යෝජනා කිරීම. | වැව් වල ආක්‍රමණකාරී ජලජ ශාක හා රොන්මඩ ඉවත් කර පිරිසිදු කිරීම වැව් බැම් ශක්තිමත් කිරීම හා නිර්මිත නවීකරණය යටතේ මේ සඳහා දැනටමත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වන අතර ප්‍රතිසංස්කරණය කල පසු එය භාරගෙන නඩත්තු කිරීම සිදුකරන ලෙස දන්වන ලදි. | වාරිමාර්ග අමාත්‍යාංශය වාරිමාර්ග දෙපාර්තමේන්තුව |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 3.3 | වාරිමාර්ග ක්ෂේත්‍රය | මුරුතවෙල ව්‍යාපාරයේ B9 ගොවීන්ට මාර්ග පහසුකම් නොමැති වීම. | වාර්ෂික ප්‍රතිපාදන මඟින් මාර්ගය සකස් කර දෙන ලෙස දන්වන ලදි. | මාර්ග සංවර්ධන අධිකාරිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 3.4 | | අඟුණකොළපැලැස්ස බෝගමුව වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු නොවීම. | මැනුම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය වේ නම්, එම කාර්යයන් සිදු කර සංවර්ධන කටයුතු සිදු කරන ලෙස දන්වන ලදි. | වාරිමාර්ග අමාත්‍යාංශය වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 3.5 | | වැව්වල රොන්මඩ ඉවත් කිරීම සඳහා පෞද්ගලික ව්‍යවසායකයින්ට අවස්ථාවක් ලබාදීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ත්‍රිවිධ හමුදාව හා ඉඩම් ගොඩ කිරීමේ දෙපාර්තමේන්තුව මේ සම්බන්ධව කටයුතු කරන බවත් වැලි සහ මඩ වෙන් කල හැකි නව තාක්ෂණය සහිත යන්ත්‍රයක් යෙදවීමේ අත්හදා බැලීම් කටයුතු මේ දිනවල සිදුවන බවත් දන්වන ලදි. | වාරිමාර්ග අමාත්‍යාංශය |
| 3.6 | | මැඩිල්ල මානජ්ජාව වැව අඩක් ප්‍රතිසංස්කරණය කර ඇති අතර ඉතිරි කොටස ප්‍රතිසංස්කරණය කල යුතු බවට යෝජනා කිරීම. | අමුණු ප්‍රතිසංස්කරණය සහ ඇල මාර්ග සංවර්ධනය, වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම, තිරසර නඩත්තු, ජල කළමණාකරණ සහ ඵලදායිතා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම යටතේ දිස්ත්‍රික්කයේ අවශ්‍යතා අනුව කටයුතු කරන බවත් එම සංවර්ධන ක්‍රියාවලියෙන් පසු ඊට අදාල ග්‍රාමීය කමිටු හඳුනාගනිමින් නඩත්තු කටයුතු සිදුකලයුතු බවට ද උපදෙස් දෙන ලදි.<br>ඒ අනුව, මෙය ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලට ඇතුලත් කරගන්නා ලෙස දන්වන ලදි. | |
| 3.7 | | ගිං නිල්වලා ව්‍යාපෘතිය නැවත ක්‍රියාත්මක කරන ලෙස යෝජනා කිරීම. | 2014 වර්ෂයේදී ආරම්භ කලද එම කටයුතු නැවතී නැවත ආරම්භ කරන ලද අතර 1 වන අදියර වසර 4 කින් හා 2 වන අදියර වසර 2 කින් නිම කිරීමට සැලසුම් කර ඇති අතර සිංහරාජ කැලයේ ඉදිකිරීමට යෝජිත වැව සම්බන්ධයෙන් ගැටළුකාරී තත්වයක් පවතින බවද වාර්තා විය. | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | | |
| 4.1 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන ක්ෂේත්‍රය | ප්‍රජා ජල අභිමානී වැඩසටහන - 2021 යටතේ වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තලපත්කන්ද ග්‍රාම නිලධාරී වසමේ ජල ව්‍යාපෘතිය සඳහා රු.මි.15ක් ප්‍රතිපාදන වෙන් කර ඇති බව දන්වන ලද අතර රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මකවන ජල සම්පාදන ව්‍යාපෘති – 2021 යටතේ තිස්සමහාරාමය ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා රු.මි. 150ක් ද අන්දරගස්යාය ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා රු.මි.45ක් ද කාලික වකුගඩු රෝග නිවාරණ වැඩසටහන සඳහා රු.මි.45.44ක්ද පුනරුත්තාපනය සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා රු.මි.7.3ක් ද ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණ වැඩසටහන සඳහා රු.මි.0.2ක් ද සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සඳහා රු.මි. 3.3ක් ද වශයෙන් හම්බන්තොට දිස්ත්‍රිකකය සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බව දැනුම් දෙන ලදී. | ව්‍යාපෘති නියමිත කාලය තුළ ආරම්භකර අවසන් කිරීම. | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 4.2 | | නිවාස සංවර්ධන අධිකාරිය මගින් ඇරඹූ ප්‍රජා ජල ව්‍යාපෘති 13ක කටයුතු අතරමග නැවතීම. | “පවස නිවන ඉලක්කයට ගමට වතුර” ජාතික වැඩසටහනට සමගාමීව මෙම ගැටළුව සඳහා කඩිනමින් විසඳුම් ලබා දීමට තීරණය විය. | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 4.3 | | දෙබරවැව සහ ලුණුගම්වෙහෙර ජල පෙරණ අළුත්වැඩියා කිරීමත් එකී ව්‍යාපෘතීන්වල දෙවන අදියර ක්‍රියාත්මක නොවීමත් හේතුවෙන් එම ප්‍රදේශ වලට ජලය අඛන්ඩව නොලැබීම. | ජල පෙරණය අළුත්වැඩියා කිරීමේ කටයුතු කඩිනමින් නිම කිරීමට දෙවන අදියර සඳහා ප්‍රතිපාදන ලබා දීම සඳහා අදාල ඇස්තමේන්තුව කඩිනම් කිරීමට ද සහ අදාල පාර්ශව සමඟ මේ පිළිබඳව සාකච්ඡා කර ගැටළු විසඳා ගැනීමටත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල යුතු ගැටළු පවතී නම් එම ගැටළු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමටත් තීරණය විය. | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | | |
| 4.4 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන ක්ෂේත්‍රය | ප්‍රජා ජල ව්‍යාපෘති මගින් සපයන ජලයෙහි ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ගැටළු පැවතීම. | ජල සම්පාදන මණ්ඩලය හරහා ප්‍රජා ජල ව්‍යාපෘති වෙත තොග ජල සැපයුම් ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇති බවත් ප්‍රජා ජල ව්‍යාපෘති බොහොමයක ගැටළු පවතින බැවින් මේ පිළිබඳව වෙනම සාකච්ඡාවක් පවත්වා අදාල ගැටළු විසඳා ගැනීමට තීරණය විය. | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 4.5 | | දිස්ත්‍රික්කයේ සියලු ප්‍රජා ජල ව්‍යාපෘති ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පැවරීම සුදුසු බවට යෝජනා විය. | මෙය ක්ෂණිකව ක්‍රියාත්මක කළ හැකි යෝජනාවක් නොවන බවත් දිගුකාලීනව මෙම ඉලක්කයට ළඟා වීම අරමුණු කර ගනිමින් දැනට ප්‍රජා ජල ව්‍යාපෘතීන්හි පවතින ගැටළු කඩිනමින් විසඳා ගැනීමට කටයුතු කිරීම සුදුසු බවට තීරණය විය. | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 4.6 | | ලුණුගම්වෙහෙර ජලාශයෙන් අක්කර අඩි 16000ක ජල ධාරිතාවයක් ජලසම්පාදන මණ්ඩලයට ලබා දෙන බැවින් කිරිදිඹය ව්‍යාපාරය සඳහා වාරි ජලය කළමණාකරණය කර ගැනීම ගැටළුවක් වී ඇති බැවින් ලුණුගම්වෙහෙර ජලාශයේ ජල ධාරිතාවය වැඩි කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කරුණු ඉදිරිපත් විය. | මේ සඳහා ප්‍රතිපාදන ගැටළුවක් නොවන බැවින් ව්‍යාපෘතිය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ඇස්තමේන්තුවක් ලබා දීමට තීරණය විය. | වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග අමාත්‍යාංශය ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 4.7 | | වකමුල්ල ප්‍රජා ජල ව්‍යාපෘතිය මගින් ජලය සැපයීම ක්‍රමවත්ව සිදු නොවීම නිසා ගැටළු මතු වීම. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අමු ජලය ලබා ගෙන උස්බිමක දී පිරිපහදු කර ජල සම්පාදන මණ්ඩලය හරහා ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා තොග ජල සැපයුම් ලබා දීමට ක්‍රමවේදයක් සකස් කිරීමටත් ඒ සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීමට දිනයක් කඩිනමින් යොදා ගැනීම සහ අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගැනීම කඩිනම් කළ යුතු බවටත් තීරණය විය. | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 4.8 | | මුරුතවෙල ජලාශය ආශ්‍රිත ප්‍රජා ජල ව්‍යාපෘතීන්හි ජලයෙහි ලවණතාවය අධික වීම. | | |
| 4.9 | | පහලගම ප්‍රජා ජල ව්‍යාපෘතියට අදාල ප්‍රජා මූල සංවිධානයන්හි මූල්‍ය අක්‍රමිකතා හේතුවෙන් ගැටළු මතු වීම. | ප්‍රජා ජල සමිති කළමණාකරණය කිරීම සඳහා ප්‍රජා ජල පනතක් කඩිනමින් සකස් කර මාස 03ක් ඇතුළත | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | සම්මත කර ගැනීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී. | සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 4.10 | ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන ක්ෂේත්‍රය | බෙලිඅත්ත මහහීල්ල පැරකුම් ප්‍රජා ජල ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු සඳහා රු.මි.4.4ක මුදලක් දකුණු පළාත් සභාව මගින් ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇතත් මෙතෙක් එම ඉදිකිරීම් කටයුතු ආරම්භ නොවීම. | මේ සඳහා ඇස්තමේන්තුව සංශෝධනය කිරීමට සිදු වූ බැවින් එකී සංශෝධිත ඇස්තමේන්තුව ප්‍රජා ජල දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත් පෙබරවාරි මාසය ආරම්භ වන විට වැඩ ආරම්භ කල හැකි බවටත් දන්වන ලදී.<br>සියලුම ජල ව්‍යාපෘතිවල පවතින ගැටළු සඳහා අවශ්‍ය කරන ඇස්තමේන්තු කඩිනමින් ලබා දෙන ලෙස ද ඒ සඳහා ප්‍රතිපාදන ලබා දිය හැකි බව ද දැනුම් දෙන ලදී. | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව<br>ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය |
| 5.1 | මහාමාර්ග ක්ෂේත්‍රය | හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා 2021 වර්ෂය තුළ “B”ශ්‍රේණියේ මාර්ග කි.මී.37ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි.300ක් ද,ග්‍රාමීය මාර්ග කි.මී.23ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි.30ක් ද මාර්ග කි.මී.100,000ක් කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ “B”ශ්‍රේණියේ මාර්ග කි.මී.42ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී.811ක් සංවර්ධනය කිරීම සඳහා රු.මි.14,500ක් ද වශයෙන් ප්‍රතිපාදන වෙන් කර ඇති බව දැනුම් දෙන ලද අතර මෙම මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන්ට අදාලව පාලම් 02ක් (වීරකැටිය මිද්දෙණිය මාර්ගයේ පිහිටි ගල්පොත්තයාය සහ කුඩා ගල් ආර පාලම්) සහ ග්‍රාමීය පාලම් 25ක් ද සංවර්ධනය කිරීමට යෝජිත බව ද දැනුම් දෙන ලදී. | ව්‍යාපෘති නියමිත කාලය තුළ ආරම්භකර අවසන් කිරීම. | මහාමාර්ග අමාත්‍යාංශය |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 5.2 | මහාමාර්ග ක්ෂේත්‍රය | මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ගල් සහ බොරළු සපයා ගැනීම අපහසු වීම. | බලපත්‍ර ලබා දීමේ ක්‍රියාවලිය සරල කිරීම. | පරිසර අමාත්‍යාංශය<br>වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය<br>මධ්‍යම පරිසර අධිකාරිය<br>වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br>භූ විද්‍යා හා පතල් කාර්යාංශය<br>මාර්ග සංවර්ධන අධිකාරිය<br>මහවැලි අධිකාරිය<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාල<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 5.3 | මහාමාර්ග ක්ෂේත්‍රය | මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා අදාල ඉඩම් අත්පත් කර ගැනීම සඳහා දිස්ත්‍රික්කයේ සියළුම අංශවල සහයෝගය ඉල්ලන ලදී. | එම සහයෝගය ලබා දීමට තීරණය විය. | අදාල අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු අධිකාරීන් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| 5.4 | | අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු හේතුවෙන් අබලන් වූ මාර්ග කොටස් නිසි පරිදි නවීකරණය නොවීම හේතුවෙන් ගමනාගමනය දුෂ්කර වීම. | එම ඉදිකිරීම් කරන කොන්ත්‍රාත් ආයතනය මගින් එම මාර්ග කොටස් නවීකරණය කිරීමට කටයුතු කරන බව ද අවශ්‍ය වුවහොත්<br>අධිවේගී මාර්ගය ඉදිකිරීම් සඳහා වෙන් කරන ලද මුදලින් මෙම<br>මාර්ග නවීකරණය කිරීමට ද තීරණය විය. | මහාමාර්ග අමාත්‍යාංශය<br>මාර්ග සංවර්ධන අධිකාරිය |
| 5.5 | | රොටවැව වැව් කණ්ඩිය ආරම්භක ස්ථානයේ සිට අවසන් වන ස්ථානය දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම.(මීටර් 500) | මාර්ග කි.මී.100,000ක් කාපට් කිරීමේ ව්‍යාපෘතිය යටතේ කි.මී 2ක් සංවර්ධනය කිරිමට නියමිත බව දැනුම් දෙන ලදී. | මාර්ග සංවර්ධන අධිකාරිය<br>මහාමාර්ග අමාත්‍යාංශය |
| 5.6 | | රොට වැව වැව් කණ්ඩිය අවසානයේ සිට අධිවේගී උමග දෙසට ඇති මාර්ගයේ ඉතිරි කොටස(මීටර් 200) ප්‍රතිසංස්කරණය කිරීම. | | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 5.7 | | මාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී අදාල ආයතන අතර සම්බන්ධීකරණය අවම වීම නිසා (ජලනල එලීම,විදුලි කණු විතැන් කිරීම ආදියේ දී) මාර්ග පළුදු කිරීම් නිතර නිතර සිදු වීම. | වර්ෂය ආරම්භයේ දී ම වර්ෂය තුළ මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දුන් ගැටළු සම්බන්ධයෙන් විදුලි බල මණ්ඩලය,ජලසම්පාදන මණ්ඩලය වැනි ආයතන සමඟ සාකච්ඡා කර අදාල ගැටළු විසඳා ගැනීමට කටයුතු කළ යුතු බව දැනුම් දෙන ලදී. | විදුලිබල මණ්ඩලය ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මාර්ග සංවර්ධන අධිකාරිය පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය |
| 5.8 | | මහාමාර්ග වලට අයත් රක්ෂිත සීමාවන්හි අනවසර වෙළඳසැල් ඉදි කිරීම. | මාර්ග ව්‍යාපෘතිවල සැලසුම් අවස්ථාවේ දී ම අදාල ඉදිකිරීම් හඳුනා ගැනිමට සහ ඉවත් කිරීමට කටයුතු කළ යුතු බවටත් එහිදී අදාල ආයතන මනා සම්බන්ධීකරණයකින් කටයුතු කල යුතු බවටත් තීරණය විය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පළාත් පාලන ආයතන මාර්ග සංවර්ධන අධිකාරිය හා රක්ෂිතය අයත් රජයේ ආයතනය පොලිසිය |
| 5.9 | මහාමාර්ග ක්ෂේත්‍රය | බෙලිඅත්ත වලස්මුල්ල මාර්ගයේ 15/3-15/4 බෝක්කු පටු වීම හේතුවෙන් වාහන ගමාගමනය දුෂ්කර වීම. | මෙම වර්ෂයේ සංවර්ධන සැලැස්මට ඇතුළත් කිරිමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී. | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 5.10 | | රළුව ඌරුබොකු ඔය හරහා පාලම ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වැඩ 2015 වර්ෂයේ සිට නතර වීම නිසා ප්‍රතිලාභීන් 1000කට පමණ ගමනාගමනය දුෂ්කර වීම. | ඉඩම් අත්පත් කරගැනීමේ දී අදාල පුද්ගලයන් විසින් ගොනුකර ඇති මානව හිමිකම් නඩුව සම්බන්ධ ගැටළුව විසඳා ගැනීමෙන් පසු ඉදිකිරීම් කටයුතු කඩිනම් කල හැකි බව දැනුම් දෙන ලදී. | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 5.11 | | තංගල්ල නගර සහා සීමාවේ මගී තදබදයක් පැවතිම. | මෙම ගැටළුව විසඳීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සොයාබලන ලෙස තංගල්ල ප්‍රධාන ඉංජිනේරු වෙත දැනුම් දෙන ලදී. | |
| 5.12 | | බෙලිඅත්ත වට රවුම සංවර්ධනය කිරීම. | ඇස්තමේන්තු සකස් කර අවසන් බවත් කඩිනමින් ඉදිකිරිම් කටයුතු ආරම්භ කරන බවත් දැනුම් දෙන ලදී. | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | | |
| 5.13 | මහාමාර්ග ක්ෂේත්‍රය මහාමාර්ග ක්ෂේත්‍රය | මාර්ග සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී කොන්ත්‍රාත්කරුවන් ප්‍රසම්පාදන පටිපාටිය යටතේ කොන්ත්‍රාත් ලබාගත්ත ද ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමන බවත් එක් කොන්ත්‍රාත්කරුවෙක් වෙත කොන්ත්‍රාත් කිහිපයක් පිරිනැමීමෙන් එක් ව්‍යාපෘතියකවත් වැඩ නියමිත පරිදි අවසන් නොකරන බවටත් කරුණු ඉදිරිපත් විය. | කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීමේ දි දිස්ත්‍රික්කය තුළ පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රමුඛතාවය ලබා දෙන බවත් අඩාල වී ඇති ව්‍යාපෘති මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් Direct labors යොදා ගනිමින් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට හෝ මග නැගුම පෞද්ගලික සමාගම මගින් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කරන බවත් දන්වන ලද අතර කොන්ත්‍රාත් ලබා දීමේ දී කොන්ත්‍රාත්කරුගේ හැකියාව පිළිබඳ සෑහීමකට පත් වේ නම් පමණක් ලබා දීමට තීරණය විය. | මහාමාර්ග අමාත්‍යාංශය මාර්ග සංවර්ධන අධිකාරිය |
| 5.14 | | ග්‍රාමීය මාර්ග කාපට් කිරීමෙන් පසු නඩත්තු කටයුතු සිදු කිරීමට ප්‍රාදේශීය සභාවලට පැවරුවත් ඊට මූල්‍යමය සහ තාක්ෂණික හැකියාවක් ප්‍රාදේශීය සභාවලට නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | කාපට් මාර්ගවල නඩත්තු කටයුතු සිදු කරන ආයතනය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බවට තීරණය විය. | මහාමාර්ග අමාත්‍යාංශය |
| 5.15 | | බෙලිඅත්ත කිරින්ද මාර්ගයෙහි ගැටමාන්න,මහහීල්ල පාලම ඉදි නොවීම හේතුවෙන් ජනතාව අපහසුතාවයට පත්ව ඇති බවට කරුණු ඉදිරිපත් විය. | පාලම් ව්‍යාපෘතිය සඳහා මෙම පාලම ඇතුළත් කිරීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 5.16 | | ගුරුගොඩැල්ල මොරයාය පාරෙහි පාලමෙහි ඉදිකිරීම් කටයුතු අතරමග නැවතීම. | “නගමු පුරවර” වැඩසටහන යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව මගින් ඉදිකිරීම් කටයුතු සිදු කරන ලද පාලම් 18ක කටයුතු කඩිනමින් නිම කිරීමට නියමිත බවත් ඊට මෙම පාලම ද ඇතුළත් බවත් දැනුම් දෙන ලදී. | |
| 5.17 | | බෙලිඅත්ත කිරින්ද මාර්ගයෙහි ඇතැම් ස්ථාන පටු වීම. | අදාල කාරණය සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. | |
| 5.18 | | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙහිගහලන්ද, තම්මැන්නාව ග්‍රාම නිලධාරී වසම්වල මාර්ග සංවර්ධන ව්‍යාපෘති 03ක කටයුතු අතරමග නැවතී ඇති | කඩිනමින් සොයා බලා කරුණු වාර්තා කරන ලෙස දැනුම් දෙන ලදී. | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | බවට කරුණු වාර්තා විය. | | |
| 5.19 | මහාමාර්ග ක්ෂේත්‍රය | ඇල්ලගල සඳුන්ගම මාර්ගයේ පාලමේ සංවර්ධන කටයුතු සිදුකර වසරක් ගත වීමට ප්‍රථම පාලමේ එක් පසක ප්‍රවේශ මාර්ගයේ ඉවුරෙහි කොටසක් කැඩී යාම නිසා ගමනාගමනය අවදානම් වීම. | "නගමු පුරවර" වැඩසටහන යටතේ රාජ්‍ය නිර්මාණ සහ නීතිගත සංස්ථාව මගින් ඉදිකිරීම් කටයුතු සිදු කරන ලද බවත් රඳවුම් මුදල් නිදහස් කිරීම මෙතෙක් සිදු කර නොමැති බවත් කඩිනමින් පිළිසකර කිරීම් සිදු කිරිමට එකඟ වී ඇති බවත් දැනුම් දෙන ලදී. | මාර්ග සංවර්ධන අධිකාරිය |
| 5.20 | | කි.මී.100,000ක් කාපට් කිරීමේ වැඩසටහනට අදාලව මාර්ග ව්‍යාපෘති සංවර්ධනය කිරීමේ දී ඊට සාපේක්ෂව කාණු පද්ධතිය සංවර්ධනය නොවීම. | එවැනි අවශ්‍යතා පවතී නම් ප්‍රධාන කාර්යාලයට වාර්තා කර අනුමැතිය ලබා ගත යුතු බවත් අනුමැතිය ලබා දීම ගැටළුවක් නොවන බවත් දැනුම් දෙන ලදී. | |
| 5.21 | | දෙමටගමුව වැව සංවර්ධනය කිරීමට සමගාමීව මාර්ගය සංවර්ධනය කළ යුතු වීම. | එය ඉටු කිරීමට තීරණය විය. | |
| 6.1 | ග්‍රාමීය නිවාස හා ඉදිකිරිම් ක්ෂේත්‍රය | ඔබට ගෙයක් - රටට හෙටක් නිවාස වැඩසටහන යටතේ2020 වසරේ නිවාස 570ක වැඩ අරඹා ඉන් 446 ක වැඩ නිමකර ඇත. ඉතිරි නිවාස 124 ක ඉදිකිරීම් කටයුතු ඉදිරි මාස තුළ දී නිම කිරීමට යෝජිත බවත්<br>2021 වර්ෂයේදී නිවාස 582 ක් ඉදිකිරීමට යෝජිත බවත් දැනුම් දෙන ලදී. | | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් ... රාජ්‍ය අමාත්‍යාංශය නිවාස සංවර්ධන අධිකාරිය |
| 6.2 | | "ඔබට ගෙයක් - රටට හෙටක් "නිවාස ණය වැඩසටහන යටතේ 2020.12.31 දිනට ලබා දී ඇති ණය සංඛ්‍යාව 133 ක් බව සහ මුදල රු.මි. 15.915ක් බවත් දැනුම් දෙන අතර මේ වන විට ඉදිරිපත් කර ඇති ණය ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කරමින් පවතින අතර කඩිනමින් ලබා දීමට කටයුතු කරන බව දන්වන ලදී. | | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් ... රාජ්‍ය අමාත්‍යාංශය නිවාස සංවර්ධන අධිකාරිය ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් ... රාජ්‍ය අමාත්‍යාංශය නිවාස සංවර්ධන අධිකාරිය |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | | |
| 6.3 | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රය | ඉන්දියානු ආධාර නිවාස වැඩසටහන යටතේ ඉන්දියානු ආධාර ගම්මාන 49ක්,<br>i අදියරේ ගම්මාන - 01<br>ii අදියරේ ගම්මාන - 24<br>iiiඅදියරේ ගම්මාන - 24 වශයෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත බවත් නිවාස ඒකක 1047 ක් ආරම්භ කර නිවාස 17 ක් නිම කර ඇති අතර ඉතිරි නිවාස කඩිනමින් නිම කිරීමට යෝජිත බව දන්වන ලදී. | | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් ... රාජ්‍ය අමාත්‍යාංශය නිවාස සංවර්ධන අධිකාරිය ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් ... රාජ්‍ය අමාත්‍යාංශය නිවාස සංවර්ධන අධිකාරිය |
| 6.4 | | අර්ධ නාගරික මහල් නිවාස වැඩසටහන යටතේ " සියපත මහල් නිවාස ව්‍යාපෘතිය "ට අදාලව මැතිවරණ කොට්ඨාස 04 තුල මහල් නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර දැනට තිස්සමහාරාමය මැතිවරණ කොට්ඨා සයේ (කොහොලංකල) ඉඩම හදුනාගෙන පරීක්ෂා කර ඇති බව දැනුම් දෙන ලදී. | | |
| 6.5 | | "මිහිඳු නිවහන" නිවාස වැඩසටහන යටතේ මෙම අමාත්‍යාංශය බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව බුද්ධ ශාසනය සඳහා දරුවන් පිදූ ආර්ථික වශයෙන් දුෂ්කර මට්ටමක සිටින නිවසක් අහිමි හෝ අඩක් සාදන ලද නිවසක් හිමි දෙමව්පියන්ගේ නිවාස අවශ්‍යතා සම්පූර්ණ කිරීමට ආධාර කිරීම අපේක්ෂිත බව දැනුම් දෙන ලදී. | | |
| 6.6 | | ඉදිකිරීම් ශිල්පීන්ගේ නිපුනතා සංවර්ධනය පිළිබඳ ජාතික වැඩසටහන යටතේ Masonry, Carpentry, Plumbing, Bar bending & Tilling සඳහා 2021 වර්ෂය සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි පුහුණු ලාභීන් 537ක් බඳවා ගැනීමට සැලසුම් කර ඇති බව දැනුම් දෙන ලදී. | | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | | | |
| 6.7 | ග්‍රාමීය නිවාස හා ඉදිකිරිම් ක්ෂේත්‍රය | අඩු ආදායම්ලාභී පවුල් වලට නිවාස ලබා දීමේ දී අනුපවුල් ප්‍රතික්ෂේප වීම. | අනු පවුල් යන්න ගැටළු සහගත බවත් චක්‍රලේඛය අනුව "ජීවත් වීමට සුදුසු තත්ත්වයේ නොමැති" පවුලක් නිවාස ආධාර ලබා දීම සඳහා තෝරා ගැනීමට ග්‍රාමීය නිවාස කමිටුවට හැකියාව පවතින බවත් දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිවාස සංවර්ධන අධිකාරිය |
| 6.8 | | නිවාස ණය වැඩසටහන්වලට අදාල අයදුම්පත්‍ර සහ අනෙකුත් අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමේ දී සාමාන්‍ය ජනතාව දුෂ්කරතාවයට පත් වීම. | ණය ලබා දීම දායකත්ව ක්‍රමයට (කුඩා කණ්ඩායම් ක්‍රමයට) සිදු කිරීමේ ක්‍රමවේදයක් සකස්කරන බවත් ඒ අනුව ණය ලබා ගන්නා පුද්ගලයන් හට ස්වයං රැකියා ආධාරයක් ලබා දීමට කටයුතු කරන බවත් දැනුම් දෙන ලදී. | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් ... රාජ්‍ය අමාත්‍යාංශය |
| 6.9 | | නිවාස ණය කොටස් වශයෙන් අවිධිමත් ආකාරයට ජනතාවට ලබා දීම හේතුවෙන් අඩු ආදායම්ලාභීන්ට වෙනත් වැඩසටහනක් යටතේ හෝ ණයක් ලබා ගත නොහැකි වීම. | එවැනි පුද්ගලයන් සඳහා ග්‍රාමීය සහ දිස්ත්‍රික් කමිටුවල නිර්දේශයකින් අනතුරුව ණය ලබා දිම සඳහා සලකා බැලිය හැකි බව දැනුම් දෙන ලද අතර මෙහිදී භූමියේ අයිතිය නිරවුල් විය යුතු බව වැඩි දුරටත් දැනුම් දෙන ලදී. | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් ... රාජ්‍ය අමාත්‍යාංශය නිවාස සංවර්ධන අධිකාරිය |
| 6.10 | | ර.500,000.00ක ණය මුදලක් සඳහා ගිවිසුම්ගත වී ඇති නමුත් එම ණය මුදලින් කොටසක් පමණක් ලද ණයලාභීන් නැවත ණය පියවීමේ දී ගෙවිය යුතු ණය මුදල නිශ්චිත නොවීම. | ණය අය කිරීම ගිවිසුම්ගත වූ මුදල මත පදනම්ව නොව ලබා දුන් ණය මුදලේ ප්‍රමාණය මත පදනම්ව සිදු කරන බව දැනුම් දෙන ලදී. | නිවාස සංවර්ධන අධිකාරිය |
| 6.11 | | නිවාස සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘතිවල පදිංචි නැති නිවාස සහ නිවාස ඉදිකර නොමැති ඉඩම් බොහොමයක් පවතින බවට කරුණු වාර්තා විය. | මෙවැනි ඉඩම් සහ නිවාස පිලිබඳ තොරතුරු සොයා නිවාස සහ ඉඩම් අහිමි පවුල් වෙත ලබා දීමේ වැඩපිළිවෙලක් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී. | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් ... රාජ්‍ය අමාත්‍යාංශය |
| 6.12 | | වැසිකිළි පහසුකම් නොමැති අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් වැසිකිළි ආධාර ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. | දිවයිනේම සමස්ත වැසිකිළි අවශ්‍යතාවය 500,000ක් පමණ වන බවත් මින් 100,000ක් පමණ ඔබට ගෙයක් වැඩසටහන මගින් ආවරණය වන බැවින් සෙසු අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා බවත් දැනුම් දෙන ලදී. | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 6.13 | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් ක්ෂේත්‍රය | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සාමෝදාගම ග්‍රාම නිලධාරී වසමේ රාජපක්ෂ මාවත,සුනාමි ගම වැනි නාගරික ප්‍රදේශවල ජනතාව සීමිත වූ ඉඩ ප්‍රමාණයකට සීමා වී ජීවත් වන බැවින් සෞඛ්‍ය සහ සමාජයීය ගැටළු රාශියකට මුහුණ පා ඇති බවට කරුණු ඉදිරිපත් විය. | මීට අදාලව ග්‍රාමීය කමිටු මගින් යෝජනා ලබා ගනිමින් පවතින බවත් ඊට අමතරව හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා විශේෂිත නිවාස සංවර්ධන වැඩපිළිවෙලක් සකස් කිරීමට අපේක්ෂා කරන බවත්, මහල් නිවාස සංකල්පය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් දැනුම් දෙන ලදී. | ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් ... රාජ්‍ය අමාත්‍යාංශය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නාගරික සංවර්ධන අධිකාරිය නිවාස සංවර්ධන අධිකාරිය |
| 7.1 | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා කටයුතු ක්ෂේත්‍රය | තිස්සමහාරාම බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම ව්‍යාපෘතියෙහි තෙවන මහල(ශ්‍රවණාගාරය) ඉදිකිරීමේ කටයුතු කඩිනමින් කළ යුතු වුවත් සංවර්ධන සැලැස්මට එය ඇතුළත්ව නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | තෙවන අදියර යටතේ මෙය ක්‍රියාත්මක කිරීමට නියමිත බව දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.2 | | අඟුණකොළපැලැස්ස වෙළඳ සංකීර්ණය නිම කිරීම.(අවසන් අදියර) | සැලසුමෙහි පැවති යම් යම් අඩුපාඩු මේ වන විට නිරාකරණය කරගෙන ඇති බවත් මෙම වර්ෂය තුළ වැඩ අවසන් කරන බවත් දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.3 | | වලස්මුල්ල පොළ සංවර්ධනය කිරීම.(අවසන් අදියර) | පෙබරවාරි මාසයේ වැඩ ආරම්භ කර මෙම වර්ෂය තුළ ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නියමිත බව දැනුම් දෙන ලදී. | |
| 7.4 | | බැංකු කලාප සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. | භූමියේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ද යටිතල පහසුකම් සංවර්ධනය කිරීම නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කරන බවත් මෙම වර්ෂයේ සංවර්ධන කටයුතු නිම කිරීමට නියමිත බවත් දැනුම් දෙන ලදී. | නගර සභාව මාර්ග සංවර්ධන අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.5 | | හම්බන්තොට නව රෝහල් චතුරශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම | | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 7.6 | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා කටයුතු ක්ෂේත්‍රය | යෝජිත වලස්මුල්ල තොග වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. | කුඹුරු ඉඩම් සඳහා වන්දි ලබා දීමේ දී තක්සේරු වටිනාකම අඩු බැවින් ඉඩම් හිමියන් භුක්තිය භාර නොදීමේ ගැටළු පවතින බැවින් එම ගැටළු කඩිනමින් නිරාකරණය කර ගැනීමෙන් පසු ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් ආරම්භ කල හැකි බවත් දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.7 | | බරවකුඹුක උප බස් නැවතුම්පොළ සංවර්ධනය කිරීම. | සැලසුම් නිර්මාණය සහ ඇස්තමේන්තු සකස් කර අවසන් බවත් 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බවත් දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.8 | | තංගල්ල නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. | සැලසුම් නිර්මාණය සහ ඇස්තමේන්තු සකස් කර අවසන් බවත් 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බවත් දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.9 | | හුංගම සතිපොළ සංවර්ධනය කිරීම. | මේ සඳහා ඉඩම හඳුනා ගැනීම දැනට සිදු කර ඇති බවත් 2022 වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට යෝජිත බවත් දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 7.10 | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා කටයුතු ක්ෂේත්‍රය | යායෙවත්ත යෝජිත කාර්යාල සංකීර්ණය ඉදි කිරිම සහ ඉදිරි සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරිම. | තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා තිබිය යුතු ප්‍රාදේශීය කාර්යාල සහ බැංකු ශාඛා පමණක් යායෙවත්ත යෝජිත කාර්යාල සංකීර්ණය තුළ හෝ ස්ථාපිත විය යුතු බවත් රාජ්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාල සියල්ල පරිපාලන සංකීර්ණය තුල හෝ එම සංකීර්ණයට ආසන්න ගොඩනැගිලිවල ස්ථාපනය විය යුතු බව තීරණය විය. (පරිපාලන සංකීර්ණය II අදියර ඉදිකිරීම් කටයුතු කඩිනම් විය යුතු බව තීරණය විය.) | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.11 | | තිස්සමහාරාම බස් නැවතුම්පොළ අවට සංවර්ධනය කිරිම. | 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බව දැනුම් දෙන ලද අතර තිස්සමහාරාම බස් නැවතුම්පොළ අවට අවිධිමත් ආකාරයට පිහිටා ඇති සියළු වෙළඳසැල් එක් වාණිජ මධ්‍යස්ථානයක් තුළ ස්ථාපිත කළ හැකි ආකාරයට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය යුතු බවට තීරණය වූ අතර මෙම ව්‍යාපෘති වලදී රථගාල් පහසුකම් පිළිබඳව විශේෂ අවධානයක් යොමු විය යුතු බව ද දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.12 | | තිස්සමහාරාම - පන්නෙගමුව පොළ සංවර්ධනය කිරීම. | පවතින අඩුපාඩු නිවැරදි කර කඩිනමින් ව්‍යාපෘතිය නිම කිරිමට තීරණය විය. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 7.13 | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා කටයුතු ක්ෂේත්‍රය | තිස්සමහාරාම පන්සල් චතුරශ්‍රය සංවර්ධනය කිරීම. | 2022 වර්ෂය තුළ නිම කිරිමට යෝජිත බව දැනුම් දෙන ලදී.තිස්සමහාරාම ප්‍රදේශයේ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් අදාල පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් වෙනම සාකච්ඡාවක් පැවැත්වීමට තීරණය විය. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.14 | | බෙලිඅත්ත නගර මධ්‍යයේ වෙළඳ සංකීර්ණය සහ පොළ සංවර්ධනය කිරීම. | දැනට ඉඩම හඳුනාගෙන ඇති බවත් 2022-2023 කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරිමට යෝජිත බවත් දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.15 | | අඟුණකොළපැලැස්ස වැව රවුම සංවර්ධනය කිරීම. | දැනට ඉඩම හඳුනා ගැනීම සහ සැලසුම සකස් කිරීම මේවන විට අවසන්ව ඇතත් වැව් තාවුල්ලේ අනවසර ඉදිකිරීම් පිළිබඳ ගැටළුව නිරාකරණය කල යුතුව ඇති බැවින් ලබන වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බව දැනුම් දෙන ලදී. වැවේ සංවර්ධන කටයුතු මහවැලි අධිකාරිය මගින් සිදු කරමින් පවතින බැවින් එම අදාල සැලසුම් සකස් කිරීමේ දී ඒකාබද්ධව කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මාර්ග සංවර්ධන අධිකාරිය මහවැලි අධිකාරිය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.16 | | වීරවිල ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම. | ඉඩම් අයිතිය නිරවුල් කර ඇති බවත් 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බවත් දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.17 | නාගරික | මුවන්පැලැස්ස ක්‍රීඩා පිටිය | ඉඩම් අයිතිය නිරවුල් කර ඇති | නාගරික |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා කටයුතු ක්ෂේත්‍රය | සංවර්ධනය කිරීම. | බවත් 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බවත් දැනුම් දෙන ලදී. | සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.18 | | සූරියවැව ආර්ථික මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම. | මෙහි පළමු අදියර නිම කර ඇති අතර දෙවන අදියර සඳහා සැලසුම් සකස් කරමින් පවතින බවත් 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බව දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.19 | | හම්බන්තොට පහළ අන්දරවැව ගුවන් තොටුපොළ සේවා මධ්‍යස්ථානය ඉදි කිරීම. | සැලසුම් සකස් කිරීම සහ ඉඩම හඳුනා ගැනීම අවසන් අතර 2023- 2024 කාල පරිච්ඡේදය තුළ නිම කිරීමට යෝජිත බව දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.20 | | තංගල්ල-පරෙයිවැල්ල සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. | මේ සඳහා ඉඩම හඳුනා ගෙන ඇති බවත් 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බව දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 7.21 | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා කටයුතු ක්ෂේත්‍රය | කටුවන බස් රථ ගමන් කරන මාර්ගය සහ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම. | මේ සඳහා ඉඩම හඳුනා ගෙන ඇති අතර සැලසුම් නිර්මාණය සිදු කරමින් පවතින බවත් 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරිමට යෝජිත බව දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන,වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය |
| 7.22 | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා කටයුතු ක්ෂේත්‍රය | කටුවන වට රවුම් මාර්ගය සංවර්ධනය කිරීම. | මේ සඳහා සැලසුම් නිර්මාණය සිදු කරමින් පවතින බවත් 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරිමට යෝජිත බව දැනුම් දෙන ලදී. | |
| 7.23 | | දෙබරවැව පොළ සංවර්ධනය කිරීම. (අදියර ii) | මේ සඳහා ඉඩම හඳුනා ගෙන ඇති අතර සැලසුම් නිර්මාණය සිදු කරමින් පවතින බවත් 2023 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරිමට යෝජිත බව දැනුම් දෙන ලදී. | |
| 7.24 | | හම්බන්තොට ප්‍රවාහන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම. | 2024- 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරිමට යෝජිත බව දැනුම් දෙන ලදී. | |
| 7.25 | | අම්බලන්තොට පොදු රථ ගාල සහ වාණිජ සංවර්ධනය කිරීම. | මේ සඳහා යෝජිත පොලිස් ස්ථානය ඉදිරිපිට පිහිටි ඉඩම කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් අතර එම ඉඩම පවරා ගැනීම සම්බන්ධ ගැටළු පවතින බැවින් අදාල පාර්ශව කැඳවා සාකච්ඡා කිරීමට දිනයක් යොදා ගැනීමට තීරණය විය. | |
| 7.26 | | තිස්සමහාරාම උසාවි චතුරශ්‍ර සංවර්ධනය කිරීම. | මේ සඳහා ඉඩම හඳුනා ගෙන ඇති අතර ඉඩම් නිරවුල් කිරිමේ කටයුතු සිදු කළ යුතු බවත් 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරිමට යෝජිත බව දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.27 | | සූරියවැව නගර මධ්‍යය සංවර්ධනය කිරීම. | ඉඩම හඳුනාගෙන ඇති බවත් 2024-2025 කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බව දැනුම් දෙන ලදී. | |
| 7.28 | | ලුණුගම්වෙහෙර හෙළ බොජුන්හල සහ කුඩා උද්‍යානය ඉදි කිරීම. | ඉඩම හඳුනාගෙන ඇති බවත් සැලසුම් කටයුතු සිදු කරමින් පවතින බවත් 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බව දැනුම් දෙන ලදී. | |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 7.29 | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා කටයුතු ක්ෂේත්‍රය | අධිවේගී මාර්ගයට පිවිසුම් මාර්ගයේ කිලෝ මීටර් 1.5ක ප්‍රමාණය නාගරික සංවර්ධන අධිකාරියට පවරමින් නිකුත් කර ඇති චක්‍රලේඛයක් හේතුවෙන් නිවාස සැලසුම් අනුමත කර ගැනීමේ දී ප්‍රදේශවාසීන් දුෂ්කරතාවයට පත්ව ඇති බවට කරුණු ඉදිරිපත් විය. | මාර්ගගත (Online) ක්‍රමයට මෙම කටයුතු කඩිනමින් ඉටු කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ඇති බව දැනුම් දුන් අතර එම ක්‍රමවේදය ජනතාවට වඩාත් පහසු ආකාරයට ක්‍රියාත්මක කිරීම සඳහා තැපැල් කාර්යාලයේ හෝ පළාත් පාලන ආයතනවල පහසුකම් සලසා දෙන ලෙස දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.30 | | තංගල්ල,මැඩිල්ල, මැදකැටිය වෙරළ මාර්ගය වසර ගණනාවක් පුරා ඛාදනය වීම. | වෙරළ තීර ආරක්ෂණ ව්‍යූහ ඉදිකිරීම (දෙවන අදියර) – (මැදකැටිය,මැඩිල්ල, හම්බන්තොට) ව්‍යාපෘතිය 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන බව දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙරළසංරක්‍ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| 7.31 | | හම්බන්තොට දිස්ත්‍රික්කයේ සංචාරක ආකර්ෂණීය ස්ථාන විශාල ප්‍රමාණයක් ඇති අතර එම ස්ථාන සංචාරකයින්ට ආකර්ශණය වන ලෙස හා පරිසර හිතකාමී ලෙස සංවර්ධනය විය යුතු බවට කරුණු ඉදිරිපත් විය. | විවේකාගාර (Changing Rooms සහිත), වැසිකිළි පහසුකම්,වාහන නැවැත්වීමේ ස්ථාන,සමර් හට්ස් , ආරක්ෂිත නාන ස්ථානය සළකුණු කිරීම,තාවකාලික වෙළඳසැල්, ආරක්ෂිත ගේබියන් බැම්ම ආදී අංග වලින් සමන්විත වෙරළ ස්නාන ස්ථාන ඉදි කිරීමේ(හිරිකැටිය,තංගල්ල) ව්‍යාපෘතිය 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බව දැනුම් දෙන ලදී. | |
| 7.32 | | කුඩාවැල්ල ප්‍රදේශයේ උම්බලකඩ හා කරවල කර්මාන්තයේ යෙදෙන අය විසින් අප ජලය හා මාළු අවශේෂ කොටස් නිසි ක්‍රමවේදයක් අනුව බැහැර නොකිරීම නිසා පරිසරයට හානි සිදු විම. | තංගල්ල, හම්බන්තොට, කුඩාවැල්ල, කිරින්ද ධීවර වරාය ආශ්‍රිතව ධීවර කර්මාන්තයෙන් සිදුවන සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුමක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට තීරණය විය. | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය |
| 7.33 | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා කටයුතු ක්ෂේත්‍රය | දිස්ත්‍රික්කයේ ජල මූලාශ්‍ර වලින් මුහුදට ප්ලාස්ටික් හා බෝතල් හා අපජලය ගලා ඒම නිසා සමුද්‍රීය දූෂණය ඉහල යාම. | MEPA ප්‍රතිපාදන මගින් පල්ලිකුඩා හා හම්බන්තොට හා අනුග්‍රාහක ආයතන මගින් තංගල්ල නගරයේ ඇළ මාර්ගයක් සඳහා බාදක යෙදීමට නියමිත බව දැනුම් දෙන ලදී. | නාගරික සංවර්ධන, |

| අ.අ | ක්ෂේත්‍රය | ගැටළු/යෝජනා | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 7.34 | | හම්බන්තොට වාණිජ වරායට හා ගමන් කරන නැව් වලට ඉන්ධන නිකුත් කිරීමේදී හදිසි තෙල් විසිරීමක් සිදුවීමේ අවධානමක් පැවතීම. | ජාතික තෙල් විසිරීමේ හදිසි සැලසුම් දිස්ත්‍රික් මට්ටමින් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින බව දැනුම් දෙන ලදී. | |
| 7.35 | | තංගල්ල වෙරළ කළාපයේ නිතර සිදුවන අනවසර ඉදිකිරීම් නිසා වෙරළ කළාපයේ සංචාරක ආකර්ෂණීය බව නොමැති වීම. | වෙරළ රැකබලාගන්නන් යෙදවීම මගින් දිනපතා 10kmක් වෙරළ තීරය පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් 2021-2024 කාල පර්ච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත බවත් මේ වන විට රජයේ හා පුද්ගලික අංශයේ දායකත්වයෙන් 10kmක් පිරිසිදු කිරීමට සැලසුම් කර ඇති බවත් දැනුම් දෙන ලදී. තවද නිල් ධජ වෙරළ වැඩසටහන 2021 – 2024 කාල පරිච්ඡේදය තුළ නිර්ණායක 32ක් යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත බව දැනුම් දෙන ලදී. | |
| 7.36 | | මත්තල අධිවේගී මාර්ගයෙන් පිටවන (Exit) ස්ථානයේ සිට 22 වංගුව දක්වා ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් විය. | නාගරික සංවර්ධන අධිකාරියට පවරා සංවර්ධනය කිරීමට තීරණය විය. | නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නාගරික සංවර්ධන අධිකාරිය |
| 7.37 | | හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආපදා කළමණාකරණය කිරීමේ දී ගිනි නිවීමේ ඒකකයක් ස්ථානගත කර ඇත්තේ තංගල්ල නගර සභා සීමාවේ පමණි. හදිසි අවස්ථාවලදී උපයෝගී කර ගැනීමට දිස්ත්‍රික්කයේ භූමි ප්‍රමාණය සහ භාවිතා කරන ප්‍රමාණය සලකා බලමින් ගිනි නිවීමේ ඒකකයක් ස්ථාපනය කිරීම සුදුසු බව තීරණය විය. | මෙම ඒකකය කළමණාකරණය කර ගැනීමේ හැකියාව ද සලකා බලා ඉදිරි කටයුතු කිරීමට තීරණය විය. | |

ඩබ්ලිව්. එච්. කරුණාරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

ඩබ්ලිව්. එච්. කරුණාරත්න
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට.

2021 පෙබරවාරි මස..11....දින
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.